සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

013135

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2000 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2000 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2000

# සංයුක්ත ගණිතය I
# இணைந்த கணிதம் I
# Combined Mathematics I

| 10 | |
|---|---|
| S | I |

පැය තුනයි / மூன்று மணித்தியாலம் / Three hours

ප්‍රශ්න හයකට පමණක් පිළිතුරු සපයන්න.

---

1. (අ) $\alpha$ හා $\beta$ යනු $x^2 - px + q = 0$ සමීකරණයේ මූල වේ. $\alpha(\alpha+\beta)$ හා $\beta(\alpha+\beta)$ මූල වන සමීකරණය සොයන්න.

(ආ) $f(x, y) = 2x^2 + \lambda xy + 3y^2 - 5y - 2$ ප්‍රකාශනය රේඛීය සාධක දෙකක ගුණිතයක් ලෙස ලිවිය හැකි වීම සඳහා $\lambda$ හි අගයයන් සොයන්න.

(ඇ) $\dfrac{2x^3 - x + 3}{x(x-1)^2}$ භින්න භාග ඇසුරෙන් ප්‍රකාශ කරන්න.

2. (අ) $n$ ඕනෑම ධන නිඛිලයක් සඳහා

$u_n = 1.n + 2.(n-1) + \ldots + (n-1).2 + n.1$ යයි ගනිමු.

ගණිත අභ්‍යුහන මූලධර්මය මගින් $u_n = \dfrac{1}{6} n(n+1)(n+2)$ බව සාධනය කරන්න.

$n$ ඕනෑම ධන නිඛිලයක් සඳහා $\dfrac{1}{u_n} = v_n - v_{n+1}$ වන අයුරින් $v_n$ සොයන්න.

ඒ නයින් හෝ අන් අයුරකින් හෝ

$$\sum_{r=1}^{n} \frac{1}{u_r} = \frac{3}{2} - \frac{3}{(n+1)(n+2)}$$ බව පෙන්වන්න.

$$\sum_{n=1}^{\infty} \frac{1}{u_n}$$ හි අගය අපෝහනය කරන්න.

(ආ) $(1+kx)^{10} = a_0 + a_1x + a_2x^2 + \ldots + a_{10}x^{10}$, $x \in \mathbb{R}$, යයි ගනිමු ; මෙහි $a_2 = \dfrac{20}{9}$ හා $k$ යනු ධන නියතයකි.

$k$ හි අගය සොයන්න.

$a_1 + a_3 + a_5 + a_7 + a_9 = \dfrac{11^{10} - 7^{10}}{2.9^{10}}$ බව පෙන්වන්න.

$a_0 + a_2 + a_4 + a_6 + a_8 + a_{10}$ හි අගය අපෝහනය කරන්න.

[ අනෙක් පිට බලන්න.

3. (අ) $\dfrac{(-1+i)^3}{(1+i)^4}$ සංකීර්ණ සංඛ්‍යාවේ මාපාංකය සහ විස්තාරය වීජීය ලෙස සොයන්න.

(ආ) $P_1$ හා $P_2$ ලක්ෂ්‍යයන් ආගන්ඩ් සටහනේ පිළිවෙළින් $z_1$ හා $z_2$ සංකීර්ණ සංඛ්‍යා නිරූපණය කරයි. ආගන්ඩ් සටහනේ $z_1 + z_2$ සංකීර්ණ සංඛ්‍යාව නිරූපණය කරන ලක්ෂ්‍යයේ පිහිටීම ලබාගැනීමට ජ්‍යාමිතික නිර්මාණයක් සපයන්න.

$z_1 = \dfrac{1+i}{1-i}$ හා $z_2 = \dfrac{\sqrt{2}}{1-i}$ සංකීර්ණ සංඛ්‍යා ආගන්ඩ් සටහනේ ලකුණු කරන්න. ඉහත ප්‍රතිඵලය භාවිතයෙන් $z_1 + z_2$ හි පිහිටීම සොයන්න.

$\tan\dfrac{\pi}{8} = \sqrt{2} - 1$ බව අපෝහනය කරන්න.

4. (අ) $\lim\limits_{x \to 0} \dfrac{1-\cos^2(2\sin x)}{1-\cos 2x}$ අගයන්න.

(ආ) $y = e^{k\sin^{-1}x}$ නම් $\dfrac{dy}{dx}\sqrt{1-x^2} = ky$ බව පෙන්වන්න ; මෙහි $k$ යනු නියතයකි.

$x = \dfrac{1}{2}$ විට $\dfrac{dy}{dx}$ සොයන්න.

(ඇ) $A$, $B$ හා $C$ නගර තුනක්, $A\hat{B}C = \dfrac{\pi}{2}$, $AB = 15$ km හා $BC = 50$ km වන අයුරින්, $AB$ හා $BC$ සෘජු මාර්ග දෙකකින් සම්බන්ධ කර ඇත. $A$ නගරය, $BC$ මාර්ගයේ $D$ නම් ස්ථානයකට සම්බන්ධ කරමින්, තවත් සෘජු මාර්ගයක් තැනීමට යෝජිත ව්‍යාපෘතියක් ඇත. මෝටර් රථයක් සඳහා $DC$ කොටස මත $50 \text{ km h}^{-1}$ ක හා $AD$ යෝජිත මාර්ගය මත $40 \text{ km h}^{-1}$ ක උපරිම වේගයන්ට අවසර ඇත.

$A$ නගරයේ සිට $x$ km දුරින් $D$ පිහිටා ඇත්නම්, අවසර ඇති උපරිම වේගයන්ගෙන් මෝටර් රථය ගමන් කරනු ලබන්නේ යයි උපකල්පනය කරමින්, $D$ හරහා $A$ සිට $C$ තෙක් මෝටර් රථයක් ගමන් කිරීමට ගන්නා ලද සම්පූර්ණ කාලය $T(x)$, පැය වලින් සොයන්න.

0 සිට 50 km තෙක් $x$ වැඩිවන විට $\dfrac{dT}{dx}$ හි ලකුණ පරීක්ෂා කරන්න.

$A$ සිට $C$ තෙක් කෙටිම කාලයකින් ගමන සම්පූර්ණ කිරීමට මෝටර් රථයකට හැකිවන අයුරින් $D$ සඳහා වඩා සුදුසු ම ස්ථානය සොයන්න.

5. (අ) සුදුසු ආදේශයක් උපයෝගී කර ගනිමින්

$$\int_1^8 \frac{1}{\left(x^{\frac{4}{3}} + x^{\frac{2}{3}}\right)}\, dx \text{ අගයන්න.}$$

(ආ) $I = \displaystyle\int_0^{\pi} e^{-2x}\cos x\, dx$ හා $J = \displaystyle\int_0^{\pi} e^{-2x}\sin x\, dx$ යයි ගනිමු.

කොටස් වශයෙන් අනුකලන ක්‍රමය උපයෝගී කර ගනිමින් $I = 2J$ හා $J = 1 + e^{-2\pi} - 2I$ බව පෙන්වන්න.

ඒ නයින් $I$ හා $J$ හි අගයයන් ලබාගන්න.

(ඇ) $\displaystyle\int \frac{x^2 - 5x}{(x-1)(x+1)^2}\, dx$ සොයන්න.

6. $x$ හා $y$ අක්ෂ මත පිළිවෙළින් $a$ හා $b$ අන්තඃඛණ්ඩ සාදනු ලබන සරල රේඛාවේ සමීකරණය ලබා ගන්න.

$\frac{x}{h} + \frac{y}{k} = 1$ මගින් දෙනු ලබන $l$, අචල සරල රේඛාවක් $x$ හා $y$ අක්ෂ පිළිවෙළින් $A$ හා $B$ ලක්ෂ්‍යවල දී හමු වේ. $l$ රේඛාවට ලම්බ $l'$ නම් සරල රේඛාවක් $x$ හා $y$ අක්ෂ පිළිවෙළින් $P$ හා $Q$ ලක්ෂ්‍යවල දී හමු වේ. $AQ$ හා $BP$ සරල රේඛාවල ඡේදන ලක්ෂ්‍යය, $(h, k)$ ලක්ෂ්‍යය රහිත $x^2 + y^2 - hx - ky = 0$ වෘත්තය මත පිහිටන බව පෙන්වන්න.

7. $x^2 + y^2 + 2g_1x + 2f_1y + c_1 = 0$ හා $x^2 + y^2 + 2g_2x + 2f_2y + c_2 = 0$ මගින් දෙනු ලබන වෘත්ත දෙක ප්‍රලම්බව ඡේදනය වේ නම් එවිට $2g_1g_2 + 2f_1f_2 = c_1 + c_2$ බව පෙන්වන්න.

$x$-අක්ෂය මත කේන්ද්‍රය පිහිටි $S$ වෘත්තයක් $x^2 + y^2 - 8x - 6y + 21 = 0$ මගින් දෙනු ලබන $S'$ වෘත්තය ප්‍රලම්බ ව ඡේදනය කරනු ලබන අතර $x^2 + y^2 + 4x + 6y + 9 = 0$ මගින් දෙනු ලබන $S''$ වෘත්තය ස්පර්ශ කරනු ලැබේ.

එකක් $S''$ වෘත්තය බාහිර ව ස්පර්ශ කරන ලෙස ද අනෙක $S''$ වෘත්තය අභ්‍යන්තර ව ස්පර්ශ කරන ලෙස ද වූ එවැනි වෘත්ත දෙකක් $S$ ට ඇති බව පෙන්වන්න.

මෙම වෘත්ත දෙකෙහි සමීකරණ සොයන්න.

8. (අ) $n \in \mathbb{Z}, \theta \neq n\pi$ හෝ $2n\pi - \frac{\pi}{2}$ සඳහා $\frac{1 + \cos\theta + \sin\theta}{1 - \cos\theta + \sin\theta} = \frac{1 + \cos\theta}{\sin\theta}$ බව පෙන්වන්න.

(ආ) සියලු තාත්ත්වික $x$ සඳහා

$8(\cos^6 x + \sin^6 x) = 5 + 3\cos 4x$ බව පෙන්වන්න.

ඒ නයින් හෝ අන් ක්‍රමයකින් හෝ $-\frac{\pi}{2} \leq x \leq \frac{\pi}{2}$ සඳහා $y = \cos^6 x + \sin^6 x$ හි ප්‍රස්තාරය දළ සටහන් කරන්න.

$-\frac{\pi}{2} \leq x \leq \frac{\pi}{2}$ තුළ $\cos^6 x + \sin^6 x = k$ සමීකරණයට

(i) විසඳුම් නොමැති වීම

(ii) විසඳුම් දෙකක් පමණක් තිබීම

(iii) විසඳුම් තුනක් පමණක් තිබීම

(iv) විසඳුම් හතරක් පමණක් තිබීම

සඳහා $k$ හි අගය හෝ අගය පරාසය අපෝහනය කරන්න.

9. (අ) $0 \leq x \leq 2\pi$ සඳහා $4\sin^2 x + 12\sin x\cos x - \cos^2 x + 5 = 0$ සමීකරණය විසඳන්න.

(ආ) ත්‍රිකෝණයක් සඳහා **සයින් නියමය** හා **කෝසයින් නියමය** ප්‍රකාශ කරන්න.

$\frac{b + c}{2k - 1} = \frac{c + a}{2k} = \frac{a + b}{2k + 1}$ බව දී ඇත; මෙහි $k$ යනු 2 ට වඩා වැඩි එහෙත් 4 ට සමාන නොවන දෙන ලද නියතයක් ද, $a, b, c$ යනු $ABC$ ත්‍රිකෝණයක, සුපුරුදු අංකනයෙන්, පාද ද, වේ.

$\frac{\sin A}{k + 1} = \frac{\sin B}{k} = \frac{\sin C}{k - 1}$ බව පෙන්වන්න.

$k$ ඇසුරෙන් $\cos A$ ද ලබාගෙන $\frac{\cos A}{(k - 4)(k + 1)} = \frac{\cos B}{k^2 + 2} = \frac{\cos C}{(k + 4)(k - 1)}$ බව පෙන්වන්න; මෙහි $A, B, C$ ට සුපුරුදු තේරුම් ඇත.